# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

# නර්තන ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු





| | |
|---|---|
| ශ්‍රේණිය | :- 06 |
| වාරය | :- ii වාරය |
| නිපුණතා මට්ටම | :- 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. |
| ක්‍රියාකාරකම | :- 5.3.1 නර්තන ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු |

සැකසුම - ආර්.ඒ.පී.ඒ.ඩී.එන්. නීලවල මිය
මප/වත් ධර්මාලෝක මහා විද්‍යාලය දඹරාව, මැණික්හින්න.
මෙහෙයවීම - නර්තන අංශය, කලාප අධ්‍යාපන කාර්යාලය, වත්තේගම

## උපදෙස්

මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යයනය කිරීම සඳහා පාසැලේ ගුරු ඇසුර ලබාගත යුතුයි.

## හැඳින්වීම

දේශීය නර්තන සම්ප්‍රදායන් වන උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් ත්‍රිත්වයේ නර්තන අංග, ශාන්ති කර්ම මත පදනම් වී ඇත.

එම ශාන්ති කර්මවල ගැබ්වූ සාම්ප්‍රදායික නර්තන අංග ඒ අයුරින් ආරක්ෂා කර ගනිමින් හා සංවර්ධනය කරමින් ඒවා ඉදිරි පරම්පරාවට දායාද කිරීමට අපේ පැරණි ප්‍රවීණ නර්තන ශිල්පීන් ඉමහත් වෙහෙසක් දරා ඇත.

මෙම පාඩමෙන් අපි සූදානම් වන්නේ ශ්‍රී ලංකාවේ නර්තන ප්‍රවර්ධනය උදෙසා දායකත්වය දුන් ශිල්පීන් තිදෙනෙකු පිළිබඳව විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමටය.

## උඩරට නර්තන සම්ප්‍රදාය

නිත්තවෙල ගුණයා ගුරුතුමා



## පහතරට නර්තන සම්ප්‍රදාය

එස්. එච්. සව්රිස් සිල්වා ගුරුතුමා



## සබරගමු නර්තන සම්ප්‍රදාය

එන්. ඒ. සිරිබෝහාමි ගුරුතුමා



ආර්.ඒ.පී.ඒ.ඩී.එන්. නීලවල

# නිත්තවෙල ගුණයා ගුරුතුමා



- 1906දී නිත්තවෙල ග්‍රාමයේ මෙම ගුරුතුමා උපත ලබයි.

- උඩරට නර්තනය, ප්‍රභූ සමාජ අවධානයට ලක් කිරීමට මුලින්ම මෙතුමා සමතෙකු විය.

- වේදිකාවට සුදුසු පරිදි ප්‍රාසංගික නර්තනය ගොඩ නැගීමට මොහු පුරෝගාමී විය.

- වයස අවුරුදු 18 දී හිස වෙස් පැළඳ එතැන් පටන් අවුරුදු 57ක් වන තෙක්ම මහනුවර දළදා පෙරහැරේ නර්තනයේ යෙදී දැයට මනා සේවයක් ඉටුකර ඇත.

- උඩරට වන්නම් 18ට අමතරව සමනළ, මහබෝ වන්නම් නිර්මාණය කරමින් නර්තනයට මහඟු දායාදයක් කර ඇත.

- 1927 දී ජර්මනියට යන්නේ, ප්‍රථමයෙන්ම නර්තනය සම්බන්ධව පිටරට නියෝජනය කල පුද්ගලයා ලෙසය.



- 1947දී නැවතත් ජර්මන් රටට ගොස් රන් සම්මානයක් දිනා ගනිමින් උඩරට නර්තනයේ උදාරත්වය ලෝකය ඉදිරියේ තබන්නට මුල් පියවර මෙතුමා ගනු ලබයි.




- 1950 වසරේදී නිදහස් දින සැමරුම් තැපැල් මුද්දරයක අසමසම පුද්ගලයාගේ රුව සඳහන්ව ඇත.


DRESSING UP...AN ART IN ITSELF

ආර්.ඒ.පී.ඒ.ඩී.එන්. නීලවල

# එස්. එච්. සව්රිස් සිල්වා ගුරුතුමා



- 1896 තංගල්ල ග්‍රාමයේදී සුවද හැන්නැදිගේ සව්රිස් සිල්වා ලෙස මෙතුමා උපත ලැබුවේය.

- මෙතුමා පහතරට නර්තනය පිළිබඳ ඉතා දක්ෂ නර්තන ශිල්පියෙකි.

- ප්‍රාසාංගික නර්තන කලාවක් ලෙස නූතන වේදිකාවට පහතරට නර්තනය ගෙන ආවා මෙන්ම මෙම නර්තනය ප්‍රචලිත කිරීමටත් මෙතුමා පුරෝගාමී විය.

- මෙතුමා සිංහල, පාලි, සංස්කෘත භාෂා පිළිබඳව හසළ දැනුමක් ඇත්තෙකි.

- මෙතුමා කවියෙක්, අධ්‍යාපනඥයෙක්, සමාජ සේවකයෙක් මෙන්ම මාධ්‍යවේදියෙකි.

- ප්‍රවීණ පහතරට නර්තන ගුරුවරයෙක් වන මෙතුමා රජයේ කලායතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කර ඇත

- 1948 දී ජයන්ති කලායතනය පිහිටුවමින් මෙතුමා සිසුන්ට සිප්සතර ලබාදුන්නේය.

- 1958 දී දෙවන එලිසබෙත් රැජිණ ලක්දිවට පැමිණි අවස්ථාවේ පැවති ප්‍රසංගයේ ප්‍රධාන නර්තන ශිල්පියා වූයේද මෙතුමායි.

- 1982දී අභාවප්‍රාප්ත මෙතුමාගේ නර්තන රංග වස්ත්‍රාභරණ කට්ටලය, දැනට ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

- එස්. එච්. සව්රිස් සිල්වා මහතාගේ කෘතින්,
  - පහතරට නැටුම් - 1965(පහතරට නැටුම් පිළිබඳ ප්‍රථම ග්‍රන්ථය)
  - සූනියම් ශාන්තිකර්මය - 1971



ආර්.ඒ.පී.ඒ.ඩී.එන්. නීලවල

# එන්. ඒ. සිරිබෝහාමි ගුරුතුමා



- 1913.08.26 වන දින පැල්මඩුල්ලේ කාමරන්ගපිටිය ග්‍රාමයේදී උපත ලැබුවේය.

- දවුල් වාදනයට, ගායනයට, නර්තනයට ඉතා දක්ෂයෙකි.

- එතුමා කලායතනයක් පවත්වා එහිදී සබරගමු නර්තනය සිසුන්ට පුහුණු කර, එය ප්‍රචලිත කළේය.

- දේශපාලන බලවතුන්ගේ ආධාර රැගෙන වියැකී යන සබරගමු නර්තන සම්ප්‍රදාය පාසල් පද්ධතියට ඇතුළු කිරීමට පුරෝගාමී විය.

- මෙතුමා සබරගමු ශාන්තිකර්ම පිළිබඳ හසල දැනුමක් ඇත්තෙකි.

- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ, සබරගමු නර්තන සම්ප්‍රදාය උගන්වන ප්‍රථම බාහිර කථිකාචාර්යවරයා ලෙස මෙතුමා නම් දැරූහ.

- 1972 වර්ෂයේදී රාජ්‍ය නර්තන කණ්ඩායමේ සබරගමු නර්තන අංශයේ ප්‍රධානියා විය.

- සබරගමු මහා සමන් දේවාලයේ පවත්වනු ලබන වාර්ෂික පෙරහැරේ සබරගමු නර්තනයට ප්‍රමුඛස්ථානය ලබා දීමට මෙතුමා කටයුතු කළහ

- අද ප්‍රාසංගික වේදිකාවේ, සබරගමු නර්තනය අත්‍යවශ්‍ය අංගයක් වී තිබීමේ ගෞරවය මෙතුමාට හිමිවේ.



ආර්.ඒ.පී.ඒ.ඩී.එන්. නීලවල